# උහ්ට වංගුව

## සමරිසි

සමරිසි අයට නීත්‍යානුකූල අයිතිවාසිකම් දීමට තමන්ගෙ ඌකමැත්තක් නැතැයි කියලා සමස්ථ ඔස්ට්‍රේලියාවෙන් සියයට හැට දෙකක් පමණ අනුමැතිය දීම මේ රටේ මිනිසුන් කොයි තරම් පුලුල් ලෙස ජීවිතය දකිනවද කියන කාරණය තහවුරු කරන්න හොඳ දර්ශකයක් කියලයි චූටි මල්ලිට හිතෙන්නෙ.

අපි හොඳටම දන්නවා අපේ බොහෝ අය මේ මත විමසුමේදී "නැත" කියන එකට කතිරය ගහලා තමන් මේ කාරණයට අකමැති බව ප්‍රකාශ කළ බව . බොහෝ ආසියාතිකයනුත් ඔවුන්ට අකතු වුණා බව රහසක් නෙවෙයි. මේකෙන් පෙනුණෙ අපේ අය තුළ ඇති පසුගාමී සිතුවිලි ය කියන එක කාටත් වැටහෙනවා. මේ කාරණයෙදි අපේ අය ඉස්සරහට ඇදගෙන කතා කළේම ලිංගිකත්වය ගැන . ඒත් සමරිසි



අයිතිවාසිකම් ප්‍රශ්ණය තුළ තිබුණෙ ලිංගිකත්වය නෙවෙයි . ආදරය . ඒ දෙක වෙනස්. අපේ අය හිතුවෙම මේ මිනිස්සුන්ට නීත්‍යානුකූල අයිතිවාසිකම් දුන්න ගමන් එදා ඉඳලා ඔස්ට්‍රේලියාවේ හැම දෙනාම සමරිසි වෙවාය කියලයි. මේ පිස්සු අදහස උඩ ඉඳලා තමයි හුඟක් දෙනා කතා කළේ. ඒත් ඈත බුදුන්ගේ සමයේත් සමරිසියන් හිටියාය කියන එකත් අදත් ඉන්නවා කියන එකත් ඒ ඉන්නා ප්‍රතිශතය ඉතාම කුඩා එකක් බවත් මේ අය අමතක කළා. ඒ අයගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් තහවුරු කලා කියලා අලුතින් ඒ අය වැඩි වෙන්නෙ නැහැ කියන එක දැන්වත් තේරුම් ගන්න අපේ අයට කල්පනාව පහළ වුණොත් ලොකු දෙයක්.

## චමරිට සප් එකක් දෙමු

ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකා චමරි අතපත්තු මෙල්බන් රෙනෙගේඩ්ස් ක්‍රිකට් කන්ඩායමට ක්‍රීඩා කරන්නට තෝරාගැනීම ඉතාම වැදගත් දෙයක්. ඒ වැඩේ පත්තු



කරපු වර්නන් තිසේරා අයියට චූටි මල්ලිගෙ හද පිරි මෙච්චා එක මෙන්න. අපි දන්නවනේ එහෙම වැඩක් සෙට් කරන එක කොයි තරම් අමාරැ දෙයක්ද කියලා. මොන කට්ටක් කාලා හරි වර්නන් අයියා සද්ද බද්ද නැතුව අපේ ක්‍රිකට් වලට දෙන සප් එක අපි අගය කරන්නම ඕනෙ

කියලා වැඩක් නෑ අප්පා අපේ ක්‍රිකට් ගැන හැමදාම අහන්න ලැබෙන්න හිත සවුත්තුවෙන දේවල්මයි. එහෙම කාලයක අපේ ක්‍රීඩිකාවක් ප්‍රථම වතාවට මෙල්බනයේ කණ්ඩායමකට් ක්‍රිකට් ගහන්න තෝරාගැනීම අර කතා වල කියන විදිහට කතරට වැටුණ වැස්සක් වගේ සුවදායක දෙයක්. වෙල් ඩන් චමරි. ඔසියන්ට මතක හිතෙන ගේමක් දෙන්න චමරිට හැකි වුණොත් ඒක තව තවත් අපේ ක්‍රීඩිකාවන්ට මෙහාට එන්න පාර විවෘත කිරීමක් වෙනවා. ඒ නිසා චමරි නංගි හිතට අරගෙන පිට්ටනියට බහින්න ඕනෙ. බය කරන්න කියන කතාවක් නෙවෙයි. ආදරේට කියන කතාවක්.

චමරි සෙල්ලම් කරන දවස් වලට පිට්ටනියට ගිහිල්ලා එයාට පොඩි සප් එකක් දෙන එක මෙල්බන් අපේ යුතුකමක් කියන එක අපේ කට්ටිය අමතක කරන්න හොඳ නැහැ. අපි ඔක්කොම යමු...ප්‍රථම වතාවට ඕසටේලියා කණ්ඩායමකට ක්‍රීඩා කරන අපේ කෙල්ලට සප් එකක් දෙමු . . . .

## අනුකම්පා විරහිත කාලගුණය

ශ්‍රී ලංකාවටත් ඔස්ට්‍රේලියාවටත් එකවර පතිත වී ඇති කලගුණ බෝම්බය නම් අතිශය දරැණුයි. මේ රටවල් දෙකේම අය කියන්නෙ දන්න කියන කාලෙක මේ වගේ වැස්සක් දුටුවෙ නැහැ කියන එකයි.



චූටි මල්ලිට නම් හිතෙන්නෙ මේ පෘථිවියේ පරිසරය මිනිසාට ඉතාම අයහපත් වෙන ආකාරයට පරිවර්තනය වෙමින් තියෙනවා කියලයි. ලෝක ප්‍රකට විද්‍යාඥයෙක් වන ස්ටීවන් හෝකින් පවා කියලා තිබුණා ඉදිරියට එන කාලය පෘථිවියට ඒ තරම් සුබ කාලයක් නොවෙන්න ඉඩ තියෙනවා කියලා.

පෘතුවිය විනාශ කරමින් ඉන්න පළමු වැරදිකාරයා මිනිසාම තමයි. අධික ලෙස හා වගකීම් රහිත ලෙස සම්පත් පරිභෝජනය කරමින් දරැනු ලෙස අපද්‍රව්‍ය පරිසරයට මුදාහරිමින් මිනිසා කරමින් ඉන්නා මේ විනාශය නැවත හැරවිය නොහැකි තරම් බරපතළයි. වායුගෝලය සහ මුහුදු ජලයට කර තිබෙන විනාශය නැවත හරවන්න අපහසු වුණාත් ඒ විනාශය අඩු කරගන්න හෝ සියලුම රටවල් එක්විය යුතු වෙලාවක ලෝක බලවතා වන ඇමරිකාව පස්ස ගැහීම සමාවක් නොදිය හැකි වරදක්. ඔස්ට්‍රේලියාවත් හොරෙන් හොරෙන් ඒ වගකීම් වලින් ඈත් වෙලා ඉන්න හැටි අපට පේනවා.

මිනිස් සංහතියේ පැවැත්ම වෙනුවෙන් මිනිසාට කළ හැකි ලොකුම මෙහෙය පරිසරය රැක ගැනීමයි. හැබැයි ඉතින් ඒ අතරවාරයේ මහ විසාල උල්කාපාතයක් කඩා වැටිලා සියලු සත්වයන් විනාශ වෙන්නත් ඉඩ තියෙනවා කියලා කියනවානෙ. ඒ නිසා දැන්වත් මිනිස් සිත් තුළ තියෙන නරක ගති බැහැර කරලා හොඳ මිනිසුන් ලෙස ජීවත් වෙන්න හැමෝම හිතට ගත්තොත් හොඳයි කියලා චූටි මල්ලිට හිතෙනවා.

ලංකාවෙත් ඔස්ට්‍රේලියාවෙත් අයහපත් කාලගුණය නිසා විපත පත් සැමට මගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන්නත් කැමතියි.

## ඔස්ට්‍රේයාවේ හොරු

මේකත් එක විදිහක හොරකමක්ම තමයි.

ඔස්ට්‍රේලියාවෙ පාර්ලිමේන්තුවට සුදුසුකම් නැතුව පත්වෙච්ච හත් අට දෙනෙකුටම ගෙදර යන්න සිදුවුණා. ඒක ඕස්ට්‍රේලියාවෙ නීතිය ක්‍රියාත්මකවීම පිළිබඳව සතුටුදායකආරංචියක්. තමන්ගෙ ද්විත්ව පුරවැසිබව හංගගෙන පාර්ලිමින්තුවට සහ



සෙනෙට් සබාවට පත්වෙච්ච මේ පිරිස ගෙදර ගියත් - ගෙදර යැව්වත් - මහජන මුදල් කාබාසිනියා කිරීම පිළිබඳව මේ අයට ලැබුණ දඬුවමක් නම් නැහැ. ඔස්ට්‍රේලියා ආණ්ඩුවට ටැක්ස් ගෙවන පුරවැසියෙක් හැටියට චටි මල්ලිට ඒ ගැන තියෙන්නෙ තරහක්.

මේ මිනිසුන් පළමුව මහමැතිවරණයට ඉදිරිපත්වීමෙන් මහජන මුදල් විනාශ කළා. දෙවෙනුව පාර්ලිමේන්තු සහ සෙනෙට් සභාවේ මන්ත්‍රිවරුන් ඇමතිවරුන් ලෙස පත්වෙලා මහජන මුදල් පරිභෝජනය කළා. වරප්‍රසාද වින්දා. දැන් තුන්වෙනුව නැවත අතුරු මැතිවරණ පැවැත්වීම වෙනුවෙන් සහ සෙනෙට් සභාවේ ඡන්ද නැවත ගණන් කිරීම වෙනුවෙන් මහජන මුදල් විනාශ කරමින් ඉන්නවා. මේ හැමද්ටම ගියේ මිලියන ගණනක් වන අපේ මුදල්. ඒ මුදල් අපට නැවත දෙන්නෙ කවුද?

මේ කරුණු කාරණා ගැන නීතය හා යුක්තිය දන්න බුද්ධිමත් අය මේවා අපට පහදා දෙනවද?

## වික්ටෝරියා ආණ්ඩුවට මල් මිටක්

වැඩිය සද්ද බද්ද නැතුව වික්ටෝරියාවෙ ආණ්ඩුව ඉතා වැදගත් වැඩක් කරමින් ඉන්නවා. වෙල් ක්‍රොසින් හෙවත් රේපාරවල් සහ මහපාරවල් එකිනෙක හරහා යාමෙන් විඳින්නට වෙලා තිබෙන කරදරය ඉවත් කරමින් සිටීම.

මේ ලියන දවස වන විට දුම්රිය හරස් පාරවල් 11ක් ඉවත් කරලා ඉවරයි. 15 ක් නිමකරමින් තිබෙනවා. තවත් 11ක ඉදිකිරීම් කටයුතු සඳහා ගිවිසුම් අත්සන් කරලා තියෙනවා. 7 ක් ටෙන්ඩර් කැඳවලා තිබෙනවා. තවත් දුම්රිය හරස්පාර 6 ක සැළසුම් සකස් කෙරෙමින් තිබෙනවා. දුම්රිය හරස්පාර 50 ක් ඉවත් කරනවා කියන්නෙ වාහන තදබදය අඩු කරන්න ගත්ත දැවැන්ත පියවරක්.

පහුවෙලා හරි මේ කරදරය ඉවත් කරන්න වික්ටෝරියා රජය ගත්ත පියවර ගැන චූටි මල්ලිට සතුටුයි. මොකද උදේ හවා වැඩට යනගමන් දුම්රිය හරස්පාර වලදි විඳින්න වෙන ගැහැට චූටි මල්ලි හොඳින්ම දන්න නිසයි. විශේෂයෙන් ක්ලේටන් දුම්රියපොළ



ළඟ හරස් පාර මතක් වෙනකොටත් තරහ යනවා.. ඇයි රෙසවෝ හන්දිය..?

ඒ එක්කම බටහිර මෙල්බන් රේල්වේ ටනල් එකත් මෙල්බන් ගුවන් තොටුපොළට ඉදිකෙරෙන දුම්රිය පාරත් වික්ටෝරියාවේ වාහන තදබදය පිලිබඳව රජය තැබූ විශාල ඉදිරි පියවර දෙකක්.

මේ සියල්ල වෙනුවෙන් වික්ටෝරියා ආණ්ඩුවට මගේ කෘතඥතාව පුදකරන්න කැමතියි. මොකද ආණ්ඩු ආවා ගියාට මහජනතාව පෙළන කරදර ගැන වද වෙන ආණ්ඩු දැකීම හරිම විරළ දෙයක් නිසා.

**චූටි මල්ලි**